## Abstract 21

# ලාංකේය සාහිත්‍ය මූලාශ්‍රයයන්ගෙන් අප්‍රකාශිත සුප්‍රසිද්ධ රාවණා චරිතය

**ආර්. එම්. එස්. ලක්මාලි රාජපක්ෂ,**
(ශාස්ත්‍රවේදී (විශේෂ) දෙවන වසර - බෞද්ධ සංස්කෘතිය),
*lakmalirajapaksha1993@gmail.com*

මහින්දාගමනයට පූර්ව අවධිය ප්‍රාග්බෞද්ධ යුගය ලෙස අර්ථවත් වන අතර මෙම යුගයේ ආගමික සාමාජික පසුබිම පිළිබඳව සාහිත්‍ය මූලාශ්‍රය රැසක් මගින් කරුණු අනාවරණය කරනු ලැබේ. මෙහි දී වැඩි වශයෙන් ම අනාවරණය වනුයේ විජයාවතරණයෙන් පසු ඓතිහාසිකත්වය යි. ශ්‍රී ලාංකේය වංශකථාකරුවා ද ඒ සඳහා දැඩි උත්සාහයක් දක්වා ඇත. එයට සමගාමීව බුදුන් වහන්සේගේ ලංකාගමනය පිළිබඳවත් විවරණය කොට ඉදිරිපත් කිරීමට උත්සාහ ගෙන ඇත. එකී කාලපරාසය තුළ වූ ජන කොට්ඨාසයන් පිළිබඳව ද පැහැදිලි විග්‍රහයක් කිරීමට මූලාශ්‍රය උත්සාහ දැරුව ද නිශ්චිත රාජවංශයක් හෝ ප්‍රමුඛ රජෙකු පිළිබඳ දත්ත අනාවරණය කිරීමට පාලි වංශකථාකරුවන් උත්සාහ ගෙන නොමැත. නමුත් භාරතීය වීර කාව්‍යයක් වන රාමායණය තුළ ලාංකේය ප්‍රාග්බෞද්ධ සමාජයේ බලසම්පන්න රජෙකු වන රාවණා පිළිබඳව අනාවරණය කෙරේ. එය කල්පිතයක් ලෙස බැහැර නො කළ හැකි අයුරින් පුරාවිද්‍යාත්මක සාධක ද නූතනයේ අනාවරණය කොට ගෙන ඇත. නමුත් ශ්‍රී ලාංකේය සාහිත්‍යකරුවන් රාවණා චරිතය ඉස්මතු නො කිරීමට හෝ යටපත් කිරීමට හෝ සවිඥානික උත්සාහයක් ගෙන ඇති බව පෙනෙන අතර ඊට බලපෑ හේතු අධ්‍යයනය කරලීම මෙම පර්යේෂණයේ අභිමතාර්ථය යි. කෙසේ වුවත් රාවණා යනු ප්‍රබල රජෙකු මෙන් ම ගුප්ත බලධාරියෙකු ද දිව්‍යමය බල සහිත පුද්ගලයෙකු ද වන බව කියැවෙන හෙයින් මොහු පිළිබඳව ශාස්ත්‍රීය අනාවරණයක් කර ගැනීම පැතිකඩ කිහිපයකින් ශ්‍රී ලාංකික සමාජයට ප්‍රයෝජනවත් වනු ඇත.

**ප්‍රමුඛ පද :** ගුප්ත බල, පාලි වංසකථා, රාමායණය, රාවණා, ලංකා ඉතිහාසය